# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2015/44 - 2017 අප්‍රේල් මස 19 වැනි බදාදා - 2017.04.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, එකී පනතේ 21 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහිටුවමින් සහ 2005 ජූනි මස 01 වන දින අංක 1395/15 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලද නියමයේ උපලේඛනය එහි I වැනි තීරයේ දැක්වෙන ''3. සත්ත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය'' යන අයිතමයට අනුරූපවන්නා වූ උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතම සහ සටහන් ඇතුළත් කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

| '' *I වන තීරය* | *II වන තීරය* |
| --- | --- |
| 4. තාක්ෂණික අධ්‍යයන පීඨය | 1. ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයන අංශය |
| | 2. ජෛව පද්ධති තාක්ෂණික අධ්‍යයන අංශය.''. |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.

05 - 91